# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1998/31 – 2016 දෙසැම්බර් 23 වැනි සිකුරාදා – 2016.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් නිරිත, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, J/140 මනිප්පායි බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මනිප්පායි ගමේ පිහිටි, යාපනය දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක YA/SND/2014/252 හා 2015.07.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'A' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1026ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' – කුසවන් පිප්පිරි – ප්‍රමාණය: හෙක්. 0.1026ක් පමණ**

උතුරට: පුද්ගලික අඩිපාර සහ හිමිකරු නොදන්නා කුසවන් පිප්පිරි නමැති ඉඩම; නැගෙනහිරට: හිමිකරු නොදන්නා කුසවන් පිප්පිරි නමැති ඉඩම සහ අඩිපාර; දකුණට: අඩිපාර සහ එන්. තන්බිරාජාගේ උරුමකරුවන් හිමිකම් කියන කුසවන් පිප්පිරි; බටහිරට: එන්. තන්බිරාජාගේ උරුමකරුවන් හිමිකම් කියන කුසවන් පිප්පිරි සහ අඩිපාර.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2014/LO/277.
2016 නොවැම්බර් මස 11 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 – 145




මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.